සැකසුම - සිතාරා විජේරත්න (සිරිසමන් ජා. පා.)
දැරණියගල කොට්ඨාසය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

## ඉගෙනුම් අත්වැල

### පෙරියතම්බි සුබ්‍රමනියම්

- 1920 වර්ෂයේ නල්ලූර්හි උපත ලැබීය.
- දෙමළ ජනතාවගේ එදිනෙදා අවශ්‍යතාවයන් හා බැඳී අභිලාෂයන් ඉටු කළ චිත්‍ර ශිල්පියෙකි.
- ඉන්දීය චිත්‍ර ශිල්පී වර්ගය සිතුවම් ශෛලියේ ආභාෂය ලැබීය.
- රවි වර්මාගේ චිත්‍රවල දක්නට ලැබෙන දෘෂ්ටි මායා ප්‍රකාශන ශිල්ප ක්‍රමය මොහුගේ චිත්‍රවල දැක ගත හැක.
- ජනප්‍රිය සංස්කෘතියේ පෝස්ටර්, කටවුට්, බැනර්, දේවරූප තිරරෙදි මොහුගේ නිර්මාණ අතර විය.

| සිතුවම් හමුවන ස්ථාන | |
|---|---|
| ඉනුබිල් පරරාසේකර් පිල්ලෙයාර් කෝවිල<br>• අගස්තියර් විනයාගර්<br>• ඇතා වල්ලිව එළවගෙන යාම | • නල්ලූර් කෛලාසපිල්ලෙයාර් කෝවිල<br>• සුදු මලයි අම්මන් කෝවිල<br>• වැල්වෙට්ටිත්තුරෙයි සිවන් කෝවිල<br>• නල්ලූර් වීර කාල අම්මන් කෝවිල<br>• වේලණෛයි අම්මන් කෝවිල |



අග්ස්තියාර් හා විනයාගර් සිතුවම



ඇතා වල්ලිව එලාව ගෙන යාම සිතුවම

අග්ස්තියාර් හා විනයාගර් සිතුවම

- ඉනුබිල් පරරාසේකර් පිල්ලෙයාර් කෝවිලේ දක්නට ඇති සිතුවමකි.
- හුණු බිත්තිය මත එනමල් වර්ණ යොදා අඳින ලද්දකි.
- අගස්තියර්ගේ කෙණ්ඩියට කපුටු වෙසින් පැමිණි විනායගර් තට්ටු කළ නිසා හටගත් කාවේරි නදියෙන් උපන් කතාව තේමා වී ඇත.
- ජීව ප්‍රමාණයට නිමවූ සිතුවම වර්ණ තානය(Tone) යොදා ගනිමින් ත්‍රිමාණ රූපීව ආකර්ෂණීයව ඇඳ ඇත.
- පර්යාලෝක ලක්ෂණ සහිතව පෙර බිමේ ඇති රූප පසුබිමේ දර්ශනවලින් තීව්‍ර කර දක්වා ඇත.
- පළමු කොටසෙන් කපුටා පලවාහරින අගස්තිය ද දෙවන කොටසින් දරුවකු බවට පත්වූ විනයාගර් කෝපයෙන් පලවා හරින අගස්තිය ද තෙවන කොටසින් පැමිණියේ විනයාගර් බව දැන යටහත් පහත්ව වන්දනා කරන අගස්තියර්ද දක්වා ඇත.
- මෙම සිද්ධි දර්ශන තුන මගින් අගස්තියර්ගේ භක්තිමත් භාවය මැනවින් ප්‍රකාශ කර ඇත.

## ඇතා වල්ලිව එළවාගෙන යාම

- ඉනුබිල් පරරාසේකර් පිල්ලෙයාර් කෝවිලෙහි දක්නට ඇත.
- බිත්තියේ තලය සකස් කිරීමකින් තොරව එනමල් තීන්ත වලින් ඇඳ ඇත.
- ඇත් වෙසින් පැමිණි බිනායගර්, වල්ලි එළවාගෙන යනු ලබන අතර වල්ලි, තපස වෙසින් පැමිණ මුරුගන්ගේ පිළිසරණ ලැබීම තේමා වී ඇත.
- ඇත් වෙසින් පැමිණි බිනායගර් සංකේතාත්මකව යොදා ඇත.
- වර්ණද සංකේතාත්මක වන අතර ඉතා දීප්තිමත් වර්ණ අඳුරාලෝකය යොදා ගනිමින් රූපවල සීමා රේඛාකරණයෙන් තොරව දක්වා ඇත.

❖ ඇතා හා බිනායගර් එක් කොටසකද, වල්ලි හා තාපසයා තවත් කොටසක් ලෙසින්ද සිද්ධි දෙකම එකම තලයක සමෝධානය වන ආකාරයට භූ දර්ශනය යොදා ඇත.

❖ ඇතාගේ බිහිසුනු බවත් වල්ලිගේ බිය මුසු හැඟීම්ද මැනවින් ප්‍රකාශිතය.

- ලබා දී ඇති ප්‍රශ්ණ සඳහා කෙටි පිළිතුරු සපයන්න.

1. පෙරියතම්බි සුබ්‍රමනියම්ගේ සිතුවම් සඳහා බලපෑවේ කවරෙකුගේ චිත්‍ර කලා ශෛලියක්ද?
2. ඔහු විසින් සිතුවම් අඳින ලද හින්දු කෝවිල් 3ක් නම් කරන්න.
3. පෙරියතම්බි සුබ්‍රමනියම්ගේ සිතුවම්හි මාධ්‍යය කුමක්ද?

**ඇගයීම**

1. පෙරියතම්බි සුබ්‍රමනියම් ශිල්පියාගේ සිතුවම් දැකිය හැකි ස්ථාන නාමාවලියක් සකසා ඒවාහි ඇඳ ඇති සිතුවම් නම් කරන්න.
2. ඔහු විසින් ඉනුබිල් පරරාසේකර් පිල්ලියාර් කෝවිලෙහි ඇඳ ඇති සිතුවම් 2ත් තෝරාගෙන

   හඳුනාගත් බව -

   ශිල්ප ක්‍රමය -

   ආභාසය -

   වර්ණ -

   ශිල්පීය දක්ෂතාවය -

භාව ප්‍රකාශනය යන තේමා ඔස්සේ කෙටි පිළිතුරු ලියන්න.